Music

**මාලිගාවක රජකෙනෙක් වත් යනවදෝ කැඳවා**

**වාසනාවන් ඒ සැඳෑවක මා ඇවිත් යනවා.**

**මානිසා ඔබ ...**

## මේ නොනිමෙන දිවි ගමනේ

මේ නොනිමෙන දිවි ගමනේ නිවනේ මග පෙනෙන තුරා

අම්මේ ඔබ පුතෙකු වෙලා මම ඉන්නම් සසර පුරා

මේ ජීවන දිවි ගමනේ නිවනේ මග පෙනෙන තුරා

**Music**

පියතුම නැති දා ඉඳලා ගියෙ නෑ මා තනි කරලා

කුසගිනි මට නොම දීලා දුක වේදනාව නිවලා

අම්මේ ඔබ බුදු වේවා මව් ගුණ ගී ගයමි මෙමා.

මේ ජීවන දිවි ගමනේ නිවනේ මග පෙනෙන තුරා

**Music**

පැටලී ලෝ මායාවෙන් ගලවා මා අවමානෙන්

නුවණැස මගේ පාදාලා දියුණුවෙ මග පෙන්වාලා

ලැබු ඒ ආසිරිවාදේ දිවි මාවත එලිය කලේ

පියතුම නැති දා ඉඳලා ගියෙ නෑ මා තනි කරලා

කුසගිනි මට නොම දීලා දුක වේදනාව නිවලා

අම්මේ ඔබ බුදු වේවා අම්මේ ඔබ බුදු වේවා

මේ නොනිමෙන දිවි ගමනේ

© 2009 සිසිල් පොන්සේකා

# මෝහෙන් මුලාවෙලා

මෝහෙන් මුලාවෙලා මානෙන් උදම්වෙලා

තණ්හාව ක්‍රෝධ ද්වේශ පාරේ

මිනිහා කොහේද මේ

රත්තරන් කෙණ්ඩියේ සිංහ තෙල් වගේ

මිනිස් ගුණේ සැමදා බැබලේ

එය රැකීම අප උරුමේ වේ.

Music

කේලම් කීමෙන් ඕපදූපයෙන් රට කොටවන වැඩ අවදානම්

උඩින් මිතුරුවී යටින් හතුරුවී උගුල් අදින්නා යයි දියවී

බොරුවෙන් රට පිරිහේවී

රත්තරන් කෙණ්ඩියේ සිංහ තෙල් වගේ

මිනිස් ගුණේ සැමදා බැබලේ එය රැකීම අප උරුමේ වේ.

Music

මා හරි උගතා මා හරි ජගතා සිතනා මිනිහා මෝඩයෙකි

අනුන් හෙලන්නට වලක් කපන්නා

එහි තුල වැටලා මියයන්නා කලදේ පලදේ මෙලෙසේ

රත්තරන් කෙණ්ඩියේ සිංහ තෙල් වගේ මිනිස් ගුණේ

සැමදා බැබලේ එය රැකීම අප උරුමේ වේ.

මෝහෙන් මුලාවෙලා මානෙන් උදම්වෙලා

තණ්හාව ක්‍රෝධ ද්වේශ පාරේ මිනිහා කොහේද මේ

රත්තරන් කෙණ්ඩියේ සිංහ තෙල් වගේ

මිනිස් ගුණේ සැමදා බැබලේ එය රැකීම අප උරුමේ වේ.

© 2009 සිසිල් පොන්සේකා

# මුහුදු රැල්ල ඔස්සේ

Music

මුහුදු රැල්ල ඔස්සේ ඔරුවක් පැද යනවෝ

නිම් වලල්ල ඔස්සේ ගෑවි ගෑවි යනවෝ

ඈත දියඹ සොයලා ඉව කරමින් යනවෝ

ඈත මෑත දැලලා අපි මාලු බාල එනවෝ

Music

ඔරුව පැදල යන්නේ රෑට නිදි මරන්නේ

අඹුවො දරු රකින්නේ අපි මාලු බාල එන්නේ//

මුහුදු රැල්ල ඔස්සේ

Music

දෑතෙ සවිය ගන්නේ ඔරුව පැදල යන්නේ

වෙරළ දුර පෙනෙන්නේ මාලු බාල එන්නේ//

මුහුදු රැල්ල ඔස්සේ..

හෝ හෝ හෝ

© 2009 සිසිල් පොන්සේකා

# මුලදි බැන්ද ආදරයක

මුලදි බැන්ද ආදරයක මිහිර දැන්

සැනසීම සොයමි මගෙ පපුවට තදකරන්

සෝකය දුක ආවත් මට කොයිතරම්

මම දාල යන්නෙ නෑ මගෙ සුදු රත්තරන්

මුලදි බැන්ද ආදරයක මිහිර දැන්

Music

අසරණ මා අමතක කෙරුවත් ඔයා

හිතුවාද ඔබව මට අමතක වෙයි කියා//

එහෙම වුණොත් යම්කිසි දවසක මෙමා

හමුවන්නෙ ඔබට මේ මගෙ මළකඳ තමා//

සෝකය දුක ආවත් මට කොයිතරම්

මම දාල යන්නෙ නෑ මගෙ සුදු රත්තරන්

Music

මල් කුමරියො සිටියත් කොතරම් කැලේ

ඒ සැවොම පරාදයි පැහැයට ඔබෙ තොලේ//

එක්වන්නට නොහැකි වුණොත් රන් කදේ

හමුවෙමු දෙන්නම එකතැන එක මිනි වලේ//

මුලදි බැන්ද ආදරයක මිහිර දැන්

සැනසීම සොයමි මගෙ පපුවට තදකරන්

සෝකය දුක ආවත් මට කොයිතරම්

මම දාල යන්නෙ නෑ මගෙ සුදු රත්තරන්

© 2009 සිසිල් පොන්සේකා

# මුතු මැණික් ආදරය නොවේ

**මුතු මැණික් ආදරය නොවේ මිල මුදල් ආදරය නොවේ**

**ආදරේට රන් ලාබ නොවේ ඔයා දන්නෙ නෑ//**

Music

**අතුපැල රාජ මැදුර අල බතල රජ බොජුන්**

**කඩමලු රජ ඇඳුම් ආදරේ ඇතිනම්**

**ශෝක වී වෙන්වි යන්නෑ හැමදාම එක වගේ**

**වේදනා වෙන්නෙ නෑ ආදරේ ඇතිනම්**

**මුතු මැණික් ආදරය නොවේ...**

Music

**වතු පිටි ගැන සිතන් නෑ රන් රිදී ලැබුණෙ නෑ**

**ඒ ගැන පසු තැවෙන් නෑ ආදරේ ඇතිනම්**

**කුල මල ජාති බේද කිසි කලෙක මතු නොවේ**

**එන දුක පැණි රසයි ආදරේ ඇතිනම්**

**මුතු මැණික් ආදරය නොවේ...**

© 2009 සිසිල් පොන්සේකා

# නවීන පන්නේ

**නවීන පන්නේ ගතිගුණ අපිට තියෙන්නේ**

**කේසර සිංහයෝ අපි වාසිටි කොල්ලෝ**

**සතටින් ඉන්නේ හන්තානේ රජදහනේ**

**කේසර සිංහයෝ අපි වාසිටි කොල්ලෝ//**

Music

**මැණිකෙල මැණිකෙල උඩරට පැත්තේ**

**නෝනල නෝනලා කොලඹ පලාතේ//**

**මැණිකෙ වුණත් එක විදියයි නෝන වුණත් එක විදියයි**

**මැණිකෙ වුණත් නෝන වුණත් නවක වදේමයි**

Music

**නවීන පන්නේ**

**බිච් බිච් ගන්නයි එන්නේ**

**ලෙක්චර් ලෙක්චර් අහගෙන ඉන්නේ**

**ඩිග්රි ඇතත් සැලකිලි ඩිග්රි නැතත් සැලකිලි**

**ගෑණු වුනත් පිරිමි වුනත් එකම සැලකිලි**

Music

**නවීන පන්නේ**

© 2009 සිසිල් පොන්සේකා

# නීල දෑස පුරා

නීල දෑස පුරා සිහින ලොවෙන් පෙරා

වෑහෙ කැලුම් නුරා මා ඔබෙ පෙම්බරා

සසරෙ එකට සරා පැමිණ පෙරුම් පුරා

ගියෙද නොසිතු යුරා මා ඔබෙ පෙම්බරා Music

මෙහේ සුවඳ ඔබේ මහද වතට එබේ

පෙරදි දිනක හවේ ලදිමි මෙවන් සුවේ

සසරෙ එකට සරා පැමිණ පෙරුම් පුරා

ගියෙද නොසිතු යුරා මා ඔබෙ පෙම්බරා

නීල දෑස පුරා.. Music

මාද ඔබද මෙසේ දෙපොල දෙතැන වෙසේ

දිනක මෙලොව කුසේ පතමි රැදෙන ලෙසේ

සසරෙ එකට සරා පැමිණ පෙරුම් පුරා

ගියෙද නොසිතු යුරා මා ඔබෙ පෙම්බරා. නීල දෑස පුරා

# නිල් මානෙල් මල්

නිල් මානෙල් මල් පිපුණා නෙත් ඇදුනා ඒ අනුරාගී

නලල ඇගේ අඩ සඳ වාගේ මිහිරි නොවෙද හදවත කාගේ

මුතු ඇට වන් දත් පෙල සුදිලේ සිනහ නැගෙ නෙත්වල කැල්මේ

ඇයගෙ දෙපා ලග මහද සැලේ එපමනි මා ලද එකම සුවේ.

දිගෙන් දිගට කාලය ගෙවුනා මල් වැරුණා මංගල උයනේ

ලස්සන කෝ කොයි අතද ගියේ වීණා තත් මැද මිහිර බිදේ

සතුට සැපත ඇතිවී නැතිවී අඳුරු වුණා මල්බර දිවියේ

තනිකම මා වට පැතිර සැලේ තනිවිය මා තරු ගිලුන රැයේ

පිසදාලා තනිකම ලෝකේ ලොව නැහැවූ සුගතිය ජලයේ

බුදුහිමි මම ඔබ හමුව ලොවේ සටනට වන්නෙමි රැයද දෙවේ.

නිල් මානෙල් මල්...

© 2009 සිසිල් පොන්සේකා

# නිම් හිම් සෙව්වා

Music

**නිම් හිම් සෙව්වා මා සසරේ හමුවී යුගයෙන් බැඳි යුගයේ**

**ලංවී වෙන්වී වරින් වරේ ඔබහා මා රන් හුයකිනි බැඳුනේ**

**ජීවේ ආශා ගැඹුරින් ගැඹුරේ ලයගින් සනහා අපමයි බැඳුනේ**

**අතරින් පතරේ වියැකීලා ඔබ මා නෙතගේ බැඳුනා**

**නිම හිම් සෙව්වා..**

Music

**ඉර හඳ සේමා පැතුමක් පැතුවා සැනසුම් සයුරේ සුසුමන් හෙලුවා**

**ජන්මෙන් ජන්මේ රැව්දීලා අද මා සටනින් දිනුවා**

**නිම හිම් සෙව්වා මා සසරේ ..**

# නිරතුරු මම

**නිරතුරු මම ඔබ ගැනම සිතන්නෙමි**

**එනමුදු එය වරදක් බව දන්නෙමි**

**පෙම් නොකරන්නට සිතුවද ඔබ වෙත**

**සෙනෙහස ලියලයි නොදැනිම හද මැද**

Inter

**මදහස දුන්නද දකින වෙලේ ඔබ මෙහි එන බව සිතිය නොහේ**

**කළයුතු කිසිවක් සිතට නොහේ මගෙ සිතුවිලි එක තැනක නොයේ**

**නිරතුරු මම ඔබ ...**

Inter

**දෙදෙනා සැනසුම ලැබිය යුතුයි දිවි ඇති තුරු ලග සිටිය යුතුයි**

**අප එක සෙවනක සිටිය යුතුයි නැත නැත අප එක් නොවිය යුතුයි**

**නිරතුරු මම ඔබ ...**

© 2009 සිසිල් පොන්සේකා 

# ඕලු පිපීලා

ඕලු පිපීලා වෙල ලෙල දෙනවා සුදට සුදේ නංගෝ

ඕලු නෙලාලා මාල ගොතාලා දෙන්නද සුදු නංගෝ

එන්න දියේ බැස මා හා දෙන්න ඔබේ අත මාලා

ඕලු නෙලාලා මාල ගොතාලා පලඳිමු අපි මාලා //

Music

වැල නොකැඩී පෙම් කෙලිමින් යන්නෝ

දණ්ඩි පැටව් නංගෝ

කුණිස්සෝ උඩ පැන පැන යන්නෝ අප කැදවා නංගෝ

මෙන්න මලක් මා නෙලුවා ඔන්න ඔබේ එය මාලා

ඕලු නෙලාලා මාල ගොතාලා පලඳිමු අපි මාලා //

Music

මා පරදිනවා ඔබගේ දෑතට මට ලැජ්ජයි නංගෝ

හිමිහිට හිමිහිට නෙලමින් යන්කෝ කලබල ඇයි නංගෝ

ඕලු මලේ සුද නාලා ඔබ රුව වැඩිවෙයි මාලා

ඕලු නෙලාලා මාල ගොතාලා පලඳිමු අපි මාලා //

Music

නෙලුවා නෙලුවා බරටම නෙලුවා බරට බරයි නංගෝ

මේවා අරගෙන වටවිල් කන්දට යමුද ඉතින් නංගෝ

අන්න මල්ලි මෙහි එනවා යමු යමු හනිකට මාලා

ඕලු නෙලාලා මාල ගොතාලා පලඳිමු අපි මාලා ////

© 2009 සිසිල් පොන්සේකා

# ඔන්චිලි චිලි

ඔන්චිලි චිලි චිල්ල මලේයා වැල්ල දීගට නෙල්ලි කැලේයා
ඔන්චිලි චිලි චිල්ල මලේයා වැල්ල දීගට නෙල්ලි කැලේයා //

මලක් වගේ ඔබ තියලා රන් ඔන්චිල්ලේ
රුකුල් දෙමී පදින්නකෝ මා සියුමැල්ලේ
චටින් පිටින් සිසිල් සුලං හමා ඇදෙන්නේ
ඔබෙයි මගෙයි කතන්දරේ තමයි කියන්නෙ
කුරුල්ලනේ බලාපියව් මගේ කිරිල්ලී
කැදැල්ලෙමයි නොයයි එහේ මෙහේ ඉගිල්ලී
මගේ කිරිල්ලී මගේ කිරිල්ලී මගේ කිරිල්ලී මගේ කිරිල්ලී
ඔන්චිලි චිලි චිල්ල මලේයා වැල්ල දීගට නෙල්ලි කැලේයා
ඔන්චිලි චිලි චිල්ල මලේයා වැල්ල දීගට නෙල්ලි කැලේයා //

වලාකුලු වගේ දුහුල් සලු කොහෙන්දෝ
රුවන් මිනි මිනි මුතු කෙසේ සොයම්දෝ
කසුන් විමන් පුලුන් යහන් කෙසේ සොයම්දෝ
නමුත් පරෙව් කුමාරි මා සතුයි නෝවේදෝ
කුරුල්ලනේ බලාපියව් මගේ කිරිල්ලී
කැදැල්ලෙමයි නොයයි එහේ මෙහේ ඉගිල්ලී
මගේ කිරිල්ලී මගේ කිරිල්ලී මගේ කිරිල්ලී මගේ කිරිල්ලී
ඔන්චිලි චිලි චිල්ල මලේයා වැල්ල දීගට නෙල්ලි කැලේයා
ඔන්චිලි චිලි චිල්ල මලේයා වැල්ල දීගට නෙල්ලි කැලේයා //

© 2009 සිසිල් පොන්සේකා

# ඕලු නෙලුම්

**ඕලු නෙලුම් නෙරිය සලාලා.. රගන්නේ**

Music

**ඕලු නෙලුම් නෙරිය රගාලා කිකිණි හඬන වලා නගාලා**

**ඕලු නෙලුම් නෙරිය රගාලා කිකිණි හඬන වලා නගාලා**

**ගගුල් තොටිල්ලේ මල් ඇතිරිල්ලේ මගෙ කුඩා ඔරුව හබල්ගා**

Music

**යමු නැලවිල්ලේ නැලවිල්ලේ නැලවිල්ලේ**

**ඇදී ඇදී යන්න නදී රිදී තොටිල්ලේ //**

**කිරල කිරලි කුඩුවේ ලගී කුරුළු පංති නාදදී නගී**

**කිරල කිරලි කුඩුවේ ලගී කුරුළු පංති නාදදී නගී**

**නැඹුරු වී වලා කුඩා සුදු වලා**

**ඔබේ රුවට වශී වෙලා නේ**

Music

**යමු නැලවිල්ලේ නැලවිල්ලේ නැලවිල්ලේ**

**ඇදී ඇදී යන්න නදී රිදී තොටිල්ලේ //**

**කබරගොයා උගේ සුරතලී සොයා ඇදෙයී නගා දිය සුලී**

**කබරගොයා උගේ සුරතලී සොයා ඇදෙයී නගා දිය සුලී**

**කොකුන් කිරි වගේ නැගෙ වෙල දිගේ**

**ඔබත් කොකුන් රැලක හැඩයි නේ**

Music

**යමු නැලවිල්ලේ නැලවිල්ලේ නැලවිල්ලේ**

**ඇදී ඇදී යන්න නදී රිදී තොටිල්ලේ //**

© 2009 සිසිල් පොන්සේකා

# පැලේ වසන රන්මලී

පැලේ වසන රන්මලී මගේ සොඳුරු සිරිමලී

ඔබේ මිහිරි ගී ඇසී අසී මම සොයා එමී රන්මලී//

Music

වෙලේ දිලෙන රන ගොයම් කරල් ඔබේ හඩට යයි නැමී//

වනේ පිපෙන මල් සිනා සිසී ඔබේ දෙපා පොඩි සිඹී

මගේ දිලිඳු රන්මලී ඉතා සොඳුරු සිරිමලී

ඔබේ මිහිරි ගී ඇසී අසී මම සොයා එමී රන්මලී//

Music

ඔබේ දිලිඳු කම යටයි සුදෝ සැබෑ සොඳුරු ගුණ නිසා

ඔබේ සිනාවක් අගේ මටා හෙලේ ඔටුන්නට වඩා

පැලේ වසන රන්මලී මගේ සොඳුරු සිරිමලී

ඔබේ මිහිරි ගී ඇසී අසී මම සොයා එමී රන්මලී//

# පාවෙලා නිල්වලාවේ

පාවෙලා නිල්වලාවේ නදී තලාවෙ රිදී ජලාසේ

ඇගේ සිනාවේ කැලුම් සැගවුණාදෝ. පාවෙලා නිල්වලාවේ

Music

දියඹ සැලෙන තරග පෙලක අතරමං වෙලා

පාලු නිල්දියේ තනිවෙලා

සොයන රුව ඔබේ අප්සරාවියේ// පාවෙලා නිල්වලාවේ

Music

තිරුණු සිතක පැතුම රැගෙන ඈත පාවෙලා

සිහින නිම්නයේ සැරිසරා

පතන රුව ඔබේ අප්සරාවියේ// පාවෙලා නිල්වලාවේ

© 2009 සිසිල් පොන්සේකා

# පණම් අටෙන්

පණම් අටෙන් මට වැඩිකර දුන්න

හැකි වුනත් බත් මිටක් දරුවට කවන්න

මාස්ටර් සර් මගෙ හිමි තැන මට දෙන්න

අනේ සර් කරුණාවෙන් සලකන්න

Music

මට මතක් වෙනව සුද්ද තෑලු පෙලු හැටි

අපි කතා කලේ පණ ගැහි ගැහි දනින් වැටී

මාස්ටර් සර් මගෙ හිමි තැන මට දෙන්න

අනේ සර් කරුණාවෙන් සලකන්න

Music

අප අතරේ කඹ ඇදිල්ලේ තරගෙ මේ

නිම වෙන්නට කල් ගතවෙදෝ

අනේ සර් අපි මිතුරන් වේදෝ

එදා දවස උදා වේ විදෝ////

© 2009 සිසිල් පොන්සේකා 

# පීනමුකෝ කලු ගගේ

**පීනමුකෝ කලු ගගේ කිරි බැබලෙන හඳපානේ//**

**දෙගොඩ තලා යන වතුරේ පවන නැගී පෙන ඉතිරේ**

**කිරි බැබලෙන හඳපානේ**

**පීනමුකෝ කලු ගගේ කිරි බැබලෙන හඳපානේ//**

music

**සුනිල් දියේ සඳ කැලුම් වැදීලා දිය රැලි හා රඟ දෙන්නේ**

**සුදට සුදේ සුදු කෙකටිය ගාලක් දිය මතුපීට ලෙලදෙන්නේ.**

**පීනමුකෝ කලු ගගේ කිරි බැබලෙන හඳපානේ//**

music

**ඕලු නෙලුම් මල් දෝත පුරාගෙන සුදු ඇඳුමින සැරසීලා**

**ඉවුර දිගේ සිරි බෝ මලුවට නොවැ මේ මහ පිරිස**

**ඇදෙන්නේ.**

**පීනමුකෝ කලු ගගේ කිරි බැබලෙන හඳපානේ//**

music

**බුදු හිමියානන් මෙලෝ දිනූ ඒ පෝය දිනේ සිරි වෙසගේ**

**සාදු නාද දෙති මහ සේනාවෝ නිවන් මගට බසිනා**

**කිරි බැබලෙන හඳපානේ**

**පීනමුකෝ කලු ගගේ කිරි බැබලෙන හඳපානේ//**

© 2009 සිසිල් පොන්සේකා

# පිටි කොටපන් නෝනේ

Music

පිටි කොටපන් නෝනේ පිටි හලපන් නෝනේ

හෙට උදේට කන්නට මට ඉදිආප්පන් ඕනේ//

ජෑම් පාන් තවත් කන්න බෑ

කිඹුල බනිස් කෑවත් මට කිසි ගතියක් නෑ

මුංඇට මට එපා කිරිබත් මට එපා//

උඹෙ අතින් රසට හදල ඉදිආප්ප ටිකක් කන්න

පිටි කොටපන් නෝනේ//

Music

ඉදිආප්ප නිකම් කන්න බෑ

කිරිහොද්ද නැතුව ඉදි ආප්පෙ ලිස්සල යන්නෑ

උම්බලකඩ දාලා සම්බෝලෙත් හදලා//

මගෙ දොළදුක නිවාගන්න ඉදිආප්ප ටිකක් කන්න

පිටි කොටපන් නෝනේ පිටි හලපන් නෝනේ

හෙට උදේට කන්නට මට ඉදිආප්පන් ඕනේ//

Music

කුකරි පොතේ රෙසිපි වැඩක් වැඩක් නෑ

හැම් බේකන් චීස් බටර් මට දිරවන් නෑ

මගෙ ආදරේ වැඩි වෙන්වයි දොළදුක මගෙ නැතිවෙන්නයි

පිටි කොටපන් නෝනේ//

© 2009 සිසිල් පොන්සේකා

# පියුමෙහි පැණිබොති

Music

**පියුමෙහි පැණිබොති වන බඹරු මල මත නොරඳති කලු දෙබරු**

**දහවල් නොදිලෙ අඹරෙ තරු අවරින් නොනැගේ නැගෙන හිරු**

Music

**කුසගිනි හැඳුනට ඉඳුල් නොකව් තණකොල නුබුදිති සිංහ පැටව්**

**කොඳ මල් නොපිපේ ගිරි මුදුනේ ගව තෙල නොදමති රන් බඳුනේ**

**පියුමෙහි පැණිබොති..**

Music

**ගැයුවට ඉම්හිරි පද උපුටා කොවුලෙකු වෙනවද කලු කපුටා**

**සුදු පැහැ හැරියේ කව්ද කිරේ මුතු නොබඳිති ගිරව්යගේ කරේ**

**පියුමෙහි පැණිබොති..**

# ප්‍රෙමයෙන් මන C

**ප්‍රෙමයෙන් මන රංජිත වේ රංජිත වේ**

**පුෂ්පයෙන් වන සුන්දර වේ ලංකෘත වේ//**

**ආලයෙන් වෙලි සැදි මෙ ලතා//**

**මණ්ඩපයෙන් චණ්ඩාතප රංජිත වේ හිරු රජිදුගෙ//**

**ප්‍රෙමයෙන් මන.. //**

Music

**කෝකිල හඩ කන් පිනවයි නන් ස්වරයයි**

**රෑන ගිරව් දෙන ගී සින්දු අම බින්දු//**

**සෑම දෙසෙ සංගීත ඇසේ//**

**පිපි තඹරණ නද බඹ දිය රැල් දෙන දිය කිදුරන//**

**ප්‍රෙමයෙන් මන .. //**

# පුන්සඳ හිනැහෙන්නේ

Music

**පුන්සඳ හිනැහෙන්නේ වනමල් පිබිදෙන්නේ**

**ලස්සන ඔබෙ මුහුණේ දැක්කම නොවැ මැණිකේ**

**කොයිබඳ ඔබ යන්නේ මේ උදයෙම අපේ ලන්දේ**

**මගෙ පැල්පත පැත්තේ ඔබ සම්පත ගෙන එන්නේ**

Music

**වසන්ත සමයෙහි ඔබ ලග ඉඳගෙන මිහිරට කවි කියමි**

**සමන් කැකුලු මල් පොකුරක් අරගෙන ඔබේ හිසේ ගසමි**

**ඔබ නිදියන තුරු පැල තුල ඉඳගෙන නැලවිලි ගී කියමි**

**උදය සවස මම ඔබෙ පා යුග හිමියනි සැමදා වදිමි**

**පුන්සඳ හිනැහෙන්නේ**

Music

**නිල්දිය බැසයන ගංගාවේ මම ඔබ හා ඔරු පදිමි**

**සඳ ඇති කාලෙට ඔබ සුදු අත ගෙන ගංදෙර වෙත දුවමි**

**පලතුරු යුෂ ගෙන මී පැණි තවරා රස කර එය පොවමි**

**කුඹුරට යන්නට පෙර බත ඇඹුලද සාදා ඔබට දෙමි**

**පුන්සඳ හිනැහෙන්නේ වනමල් පිබිදෙන්නේ**

**නිල් දිය බැස යන්නේ ආසිරි පුද දෙන්නේ**

**මොණරුන් රග දෙන්නේ පොඩි කුරුලන් නද දෙන්නේ**

**අප දෙස බලමින්නේ උන් හැම දෙන සැනසෙන්නේ.**

**හා හා හා**

# පුරුතුගීසි කාරයා

පුරුතුගීසි කාරයා රටවල් අල්ලන්න සූරයා

හතුරුරාජ මාරයා මුලුලෝ හොල්ලන්න වීරයා //

Music

කොළඹට ආවේ ඉඳලයි ලිස්බන් නගරේ

අප ආ පරේ පැතිරේ විනෝද මිහිරේ //

පැතිරේ විනෝද මිහිරේ පැතිරේ විනෝද මිහිරේ විනෝද මිහිරේ

පුරුතුගීසි කාරයා ..

කන්න හපන්නු බොන්නත් එහෙම හපන්නු

රටත් වැඩියෙන් යුද්දෙට හරිම හපන්නු//

යුද්දෙට හරිම හපන්නු යුද්දෙට හරිම හපන්නු විනෝද මිහිරේ

පුරුතුගීසි කාරයා..

වයින් බෝතලේ ඇති තැන විනෝද මිහිරේ

වැඩියෙන් ගත්තොත් යා හැකි දෙව්ලොව පාරේ//

යා හැකි දෙව්ලොව පාරේ යා හැකි දෙව්ලොව පාරේ විනෝද මිහිරේ

පුරුතුගීසි කාරය..

Music

අපේ තුවක්කු ඉහලම කාල තුවක්කු

ගහන්න වෙනවා වැදුනොත් ලෝකෙට මුක්කු//

වැදුනොත් ලෝකෙට මුක්කු වැදුනොත් ලෝකෙට මුක්කු විනෝද

මිහිරේ. පුරුතුගීසි කාරයා..

Music ඒක උගන්නන්න තමයි යුද්ධ කරන්නේ

කාල තුවක්කුයි බයිනෙත්තුයි හරවන්නේ//

බයිනෙත්තුයි හරවන්නේ බයිනෙත්තුයි හරවන්නේ විනෝද මිහිරේ

පුරුතුගීසි කාරයා..

© 2009 සිසිල් පොන්සේකා

# රස ආහර කවලා

රස ආහර කවලා රන් කුඩුවෙ දමලා

ඇති කරන්න ගත්ත මාල ගිරවී

අත හරින්න කියලා ඇයි කියන්නේ ඔහෙලා

හිතුවද අෑ දාල යයි කියාලා//

Music

මම බත් කෑවද ගිරවි කියල ඇහුවම, ඔව් මම බත් කෑව කියනවා

මම ගිරවි ගිහින් කැලේ අත හරින්නද අනේ අනේ එපා කියනවා

අපි ඇති කෙරුවක් රන් කුඩුවෙ දමලා

කුස පිරෙන්න රස ආහර කවලා

ගිරවුන් යනවලු ලැබුනොත් පැනලා ඔබ යනවද මටත් එහෙම කරලා

වත්තෙ මල් පිපෙන්නෙ නෑ ගෙදර සිරියාවක් නෑ

ඔබ නැතිනම් මේ දේවල් නෑ

ගිරවුන් හොදනෑ මේ ගිරවි එහෙම නෑ

අත හැරියත් දාල යන්නෙ නෑ

රස ආහර..

Music

ඔබේ රෑන සමග පියඹාගෙන යන්න කුඹුරට ගොස් අහුලාගෙන කන්න

කැලේ ගහක රෑ කාලේ ගෙවන්න ඔබට ආස නැද්ද ඒ විදියට ඉන්න

ලස්සන මල් වතුවල ගැවසෙන්න වලාකුලු ඉරාගේන ඉගිලෙන්න

නෙලාගෙන ඇවිත් පලතුරු කන්න

ඔබට ආස නැද්ද ඒ විදියට ඉන්න

ඒ විදියට ඉන්න ආසදැයි බලන්න කුඩුවෙ දොර ඇරල තියන්න

මාව දාලා යන්න බෑ නේද කියන්න මට ආසයි එය දැනගන්න

රස ආහර..

# රටකින් එහා

Music

රටකින් එහා ඉගිලී තනිවෙන්න බෑ

සිතකින් නොවේ කිසිදා හැරයන්නෙ මා

අද මෙන් ළඳේ නෑ හමුවෙන්නේ මා

ගෙනයමි ඔබේ ආදරේ ආදරේ.

Music

නා දලු දෙතොල් පටලැවී පටලැවී

ආ ගිය ගමන් සිහිව ඒ යලි යලි

අසමාන වූ ඒ අප ආදරේ ඒ

කිසිදා බිඳෙන් නෑ සැකයක් නැතේ.

රටකින් එහා..

Music

අතිනත වෙලා පටලවා රන් රුවෙන්

ඔබ ගෙන යමි සපුරලා සිතු පැතුම්

හෙට ඒ දිනේදී සයුරෙන් එහා

පිලිගන්නවාදෝ පැමිනී වහා..

රටකින් එහා..

Music

© 2009 සිසිල් පොන්සේකා

# රත්න දීප ජන්ම භූමි
Introduction

රත්න දීප ජන්ම භූමි ලංකා දීප විජය භූමි

රත්න දීප ජන්ම භූමි ලංකා දීප විජය භූමි

මේ අපේ උදාර වූ මාතෘ භූමියයි මාතෘ භූමියයි

ආදි සිංහලේ වීර මී මුතුන් ලෙයින්

සාර වූ උදාර වූ මාතෘ භූමියයි මාතෘ භූමියයි

Music

මාණික්‍ය සේ පොලෝ තලේ නිධාන වී Music

මාණික්‍ය සේ පොලෝ තලේ නිධාන වී

ඇත්තෙ ඒ අභීත දූ පුතුන්

ජාතියේ නාමයෙන් සංග්‍රාම භූමියේ //

ජීවිතේ පුදා හෙලූ ලේ කඳයි
Music

ගංගා තරංග රාව දී රිදී වනින් Music

ගංගා තරංග රාව දී රිදී වනින්

මල් පිපී කුලෙන් කුලේ හැපී

ගායනා කරන්නේ ආකාශයේ නැගී //

වීරයින්ගෙ ඒ යශෝ ගීතයයි
Music

සිංදුපමාන වැව් තලා මතින් නැගී Music

සිංදුපමාන වැව් තලා මතින් නැගී

පද්ම රේණුයෙන් සුගන්ධ වී

රන් කරල් නමා හමා සිත් ප්‍රබෝධයෙන් පුරා

එන්නෙ උන් හෙලූ ප්‍රාණ වායුවයි

Music

රත්න දීප..

© 2009 සිසිල් පොන්සේකා

# රුවන් අඹර

## Inroduction

**රුවන් අඹර සෙමෙර සලන වලා පෙළගැසේ**

**ආතරයේ මැණික තොරන් දෑස මුණගැසේ**

**නිමල් මදුර මිහිර මවන සොඳුරු ජීවිතේ**

**කමල් සුවඳ මවා ගෙනේ අමර තුසිතේ**

Inter

**ගඟුලැල්ලේ මලින් මලට පෙණපිඬු නැගුනා**

**නෙලුම් විලේ මලින් මලට සුවඳ පැතිරුණා**

**ගඟුලැල්ලේ මලින් මලට පෙණපිඬු නැගුනා**

**නෙලුම් විලේ මලින් මලට සුවඳ පැතිරුණා**

**ආදර ලෝකේ නෑ දුක සෝකේ //**

**රුවන් අඹර..**

Inter

**ලා පත් සිඹ සිඹ සීතල නලවැල් ඇදුනා**

**සඳා ආදරේ සිහිලැල් රන් තරු එතුනා**

**ලා පත් සිඹ සිඹ සීතල නලවැල් ඇදුනා**

**සඳා ආදරේ සිහිලැල් රන් තරු එතුනා**

**ආදර ලෝකේ නෑ දුක සෝකේ**

**ආදර ලෝකේ නෑ දුක සෝකේ**

**රුවන් අඹර..**

© 2009 සිසිල් පොන්සේකා 

# රගහල දැන් ඇත

රගහල දැන් ඇත අඩ අඳුරේ අප දෙදෙනා පෙම් පිළිසඳරේ
අන්න බලන් කුමරිය මනමේ තනිවී ඇත හිමගිරි අරණේ

දිරියෙන් යුද කල ඔබ දුටු මොහොතේ
මගෙ හද ගැබ තුල ඇතිවිය ආලේ
නැතිමුත් රජසැප හිමගිරි අරණේ
ඔබ හැර සැපතක් නැත අන් සරණේ
අවසන් වසරෙදි සරසවියේ ඔබෙ අත අරගෙන හන්තානේ
කඳු පාමුල මහවැලි සෙවණේ හමුවූ කුමරිය ඔබද ලදේ.

රගහල දැන් ඇත අඩ අඳුරේ අප දෙදෙනා පෙම් පිළිසඳරේ
අන්න බලන් කුමරිය මනමේ තනිවී ඇත හිමගිරි අරණේ

හැඩි දැඩි සිරුරට ආලය කෙරුවා
ඔබ හට අසිපත දෙන්නට සිතුනා
මනමේ කුමරුන් මරුමුව වැටුනා දැන් මම රැජිනකි හිමගිරි අරණා
අවසන් වසරෙදි සරසවියේ ඔබෙ අත අරගෙන හන්තානේ
කඳු පාමුල මහවැලි සෙවණේ හමුවූ කුමරිය ඔබද ලදේ.
රගහල දැන් ඇත අඩ අඳුරේ අප දෙදෙනා පෙම් පිළිසඳරේ
අන්න බලන් කුමරිය මනමේ තනිවී ඇත හිමගිරි අරණේ

© 2009 සිසිල් පොන්සේකා

# රෑ පැල් රකින AM

**Am                                        E**
**රෑ පැල් රකින කුරහන් පැහෙනා හේනේ**
**                        Dm       Am**
**මගෙ තනි නොතනියට උඹවත් නැතුවානේ**
**                    Dm       Am        E**
**හෙට දින උඹත් දීගෙක ගිය පසු නෑනේ**
**                  Dm       Am**
**මාසේ පෝය දා වාගෙයි ගම්මානේ**

Music
**Am                    D           Am   E**
**එගොඩහ ගොඩෙ ඉස්මත්තෙදි දුටුවාට**
**                    Dm        Am**
**ඇලකන්ඩියේ ඉදගෙන අත වැනුවාට**
**                Dm        E**
**මගෙ හිතු මනාපෙට මං බහ දුන්නාට**
**                    Dm      Am**
**නාඩන් මස්සිනේ පෙරපින් නැතුවාට**

Music
**Am                                    E**
**හැදුවෙ ගෙපැල මට තනියම ඉදින්නද**
**                    Dm       Am**
**බාලේ සිටන් බැදි ආලේ බිදින්නද**
**                Dm     Am        E**
**රෑ තුන් යමේ මේ හැටි දුක් දෙවන්නද**
**                    Dm          Am**
**සිහිනෙන් මිසක් හැබැහින් එක් නොවන්නද**

Music
**Am                    D          Am   E**
**නෑනා නැතත් කල දවසක් ගෙවෙන්නයි**
**                    Dm        Am**
**සිටු කුමරියක් කර කාරෙට ලැබෙන්නයි**
**                Dm        E**
**පත්තිනි ගම්බාර දෙවියන් රකින්නයි**
**                    Dm      Am**
**කුරහන් කපන දා මා සිහි කරන්නයි**

**රෑ පැල් රකින...**

© 2009 සිසිල් පොන්සේකා

# රෑ රැසේ

රෑ රැසේ අදිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා

රන් රසේ එකවන ලෙසේ වෙණ නාදදී පා තබ තබා

කම් පසේ දෙන සර ලෙසේ දෙස බල බලා නෙතගින් සබා

මම් කෙසේ පවසම් එසේ වර සුර ළඳුන් දුන් රග සොබා

Music

පුල් මදාරා මල් දමින් මුදු දුගු සුනිල් වරලස ගොතා

මන් නදා කිතුලිය ලෙසින් සුර, තුර සරා දිලි මුතු ලතා

මන් නදා වන මිණී මෙවුල් නද වෙණ හඬින් එක්කොට ඉතා

උන් එදා දුන් රග දුටොත් තව සක් සැපක් කවරෙක් පතා

Music

පිපි සමන් කුසුමන් පටින් දන රන් ගසුන් මෙන් මන් බැදේ

ලඹ සවන් දිගු රන් පටින් දන නෙත් නුවන් බදිමින් තදේ

මද පවන වැද ලෙල පහන් සිලු මෙන් රැගුම දෙන රන් බදේ

මේ ඔවුන් රූ සිරි නුවන් වන් බඹ වුවත් දැහැනින් මිදේ

# සැළලිහිනි කොවුල්

සැළලිහිනි කොවුල් හඬ රැව් දෙන්නා මහ උයනක සිරි ඉතිරේ

මුව රළ අතරේ වග වලසුන්ගේ රඟ මඩලකි මේ උයනේ //

Music

නීල කොබෝ රෑන ගිරා පිල් විදහා රඟනා මොනරා//

කට ඇද කිරලා සහ වලි කුකුලා හොට දිග පිලිහුඩුවා

අප දැකලා බිය වැදිලා තරගෙට හඬ නැගුවා.

සැලලිහිනි කොවුල්..

Music

කොල දිවියා රලු කොටියා කපටි රජා නම් ලද හිවලා

විසකුරු පොලගා මිනි කන කිඹුලා පොතුහැර කබරගොයා

රට පිඹුරා ලගම නයා දරණ ගසා සිටියා.

සැලලිහිනි කොවුල්..

© 2009 සිසිල් පොන්සේකා

# සඳත් බැස ගියා

සඳත් බැස ගියා අවරගිරේ ඉරක් උදා කරලා

මටත් ලොවක් තිබුණා මතකයි මම ඉමි සිහිකරලා

දෙලුම් මල් පිපුණු දෙවැට දිගේ පාසැල් ගිය කාලේ

මල් වගේ සිනාසුනු කෙල්ලන් හා මතකයි මගෙ බාලේ

මල් වගේ සිනාසුනු කෙල්ලන් හා මතකයි මගෙ බාලේ

Music
විවේකයක් ලද විටදි අපි දුව පැන ඇවිදිනවා

ගණන් තමයි මගෙ හිතට වදේ නිතරම වරදිනවා

ගමේ පාසැලේ වැඩට අපි පෙරමුණ ගෙන යනවා

තවත් වරක් Music තවත් වරක් මට පාසැල් යන්නට

ලැබුණොත් මම යනවා

Music

ඉමක් කොනක් නැති අහස වගේ කෙළිලොල් දිවිය මගේ

මලක් පිපී සුවදින් පිරුණා සේ මුහුණේ සිනහ නැගේ

දුකක් සිතේ දැනුනේ නෑ මා හට අද මට දැනෙනු වගේ

තවත් වරක් Music තවත් වරක් මට පාසැල් යන්නට

ඇත්නම් හරිම අගේ

දෙලුම් මල් පිපුණු දෙවැට දිගෙ පාසැල් ගිය කාලේ

මල් වගේ සිනාසුනු කෙල්ලන් හා මතකයි මගෙ බාලේ

මල් වගේ සිනාසුනු කෙල්ලන් හා මතකයි මගෙ බාලේ.

පොඩි කාලේ

© 2009 සිසිල් පොන්සේකා

# සැඳෑ අඳුර ලොව

**සැඳෑ අඳුර ලොව ගලන වෙලාවට**

**කවුලු පියන් පත් වැසෙන වෙලාවට මිළුසඹුව**

**දහසක් දොම්නස් සිහින පවුරු මැද**

**තනිවුණු ඔබේ සුසුමන් සෙමෙන් චිත්**

**මගෙ සවණත පාරයි//**

Music

**තෙරක් නොමැති සිතුවිලි සයුරක් මැද**

**සරන විටදි රෑය ගෙවෙන තුරාවට//**

**මහද සෙනෙහෙ ඔරුවේ නැගී ඔබ**

**එතෙර වන්න නිබදේ නිදිලොව වෙත එතෙර වන්න නිබදේ**

**සැඳෑ අඳුර ලොව**

Music

**නිමල පැතුම් සපුරාගෙන හද තුල**

**සිහින ලොවෙන් නෙත ඇරෙන වෙලාවට//**

**අරුණලු නැගෙන පැයේ කුසුමක් වෙමි**

**ජීවන මල් ගොමුවේ ඔබෙ ආදර ජීවන මල් ගොමුවේ**

**සැඳෑ අඳුර ලොව**

© 2009 සිසිල් පොන්සේකා

# සැනසෙන් නැලවෙන්

Music

**සැනසෙන් නැලවෙන්න සුදෝ සැනසන් නැලවෙන්න සුදෝ**

**රසකර ගී ගයන වෙලේ රසකර ගී ගයන වෙලේ**

**සැනසෙන් නැලවෙන්න සුදෝ** Music

**කොවුලන්ගෙ ගී අසාලා නිදියයි සිහින බලාලා**//

**රසකර ගී ගයන වෙලේ රසකර ගී ගයන වෙලේ**

**සැනසන් නැලවෙන්න සුදෝ** Music

**මදනල හිම්හිට හමලා තුරු ලිය ටික ටික සොලවා**//

**රසකර ගී ගයන වෙලේ රසකර ගී ගයන වෙලේ**

**සැනසෙන් නැලවෙන්න සුදෝ ..**

# සොබා අලංකාරය මුහුණේ F

**සොබා අලංකාරය මුහුණේ තමන්ට දැකගන්නට බැහැනේ**

**බලන්නෙ ඒ ශ්‍රියාව කැඩපතට එබීලයි වන වැල්ද දැවටෙන්න සරණේ සොයයි**//

Music

**සුසීත ගංගා තලේ නීල දිය ඇල්ල වෙරලේ එලේ** music

**සුසීත ගංගා තලේ නීල දිය ඇල්ල වෙරලේ එලේ**

**ඔරු පාරු තිබුණාට ඉන් නෑ පලේ**//

**පැදයන්න හබලක්ද ඕනෑ ජලේ හො හෝ හො හෝ**

**සොබා අලංකාරය මුහුණේ** Music

**පැසිලා ඇති පාඩුවේ මිහිරි රසදායී පළ ජාති වේ** Music

**පැසිලා ඇති පාඩුවේ මිහිරි රස දායී පළ ජාති වේ**

**දුරදීම දැකලා පෙනේදෝ කෙසේ ගෙඩි කන්නෙ නැති දිවට නොදැනේ රසේ.**

**සොබා අලංකාරය මුහුණේ**

# සසර වසන තුරු

Music

**සසර වසන තුරු නිවන් දකින තුරු//**

**පින් කෙත හෙල රන් දෙරණේ යලි උපදින්නට**

**හේතු වාසනා වේවා හේතු වාසනා**

Music

**රත්නමාලි සෑ කිරණයි මහ බෝ සෙවණයි**

**තිසා වැවයි සීගිරියයි මගේ උරුමයයි**

**රත්නමාලි සෑ කිරණයි මහ බෝ සෙවණයි**

**තිසා වැවයි සීගිරියයි මගේ උරුමයයි**

Music

**සසර වසන..** //

# සඳවට රන්තරු

**සඳවට රන්තරු කැකුලු පිපේවා හිරුට වලාකුලු සලු පැලදේවා**

**පොලොවෙහි මිණි මුතු කැට බිහිවේවා පුතෙකුට අම්මගෙ අගය දැනේවා**

Music

**ගඟුලට ඇති බර දියරල නේදෝ කතරට ඇති හර සුදු වැලි නේදෝ**

**ලඳකට ඇති හැඩ යහ ගුන නේදෝ මවකට ඇති සැප දරු සැප නේදෝ**

**සඳවට රන්තරු** Music

**ගින්නක නැති කල දුමක් කොයින්දෝ පින්නක් නැති කල තෙතක් කොයින්දෝ**

**වහලක් නැති කල ගෙයක් කොයින්දෝ අම්මෙක් නැති කල දැයක් කොයින්දෝ. සඳවට රන්තරු**

© 2009 සිසිල් පොන්සේකා

# ශාන්ත මේ රෑ යාමේ

ශාන්ත මේ රෑ යාමේ දේ කුමුදු මලේ සිරියා

සද කාන්ති නැගී සෞම්‍යා// ඒ නැගි හද ප්‍රෙම තරංගා//

ඒ අමා දහරේ නෙක තුරුලිය හිනැහෙන්නේ මේ සීතල සද පානේ

ශාන්ත මේ රෑ යාමේ..

Music

හා ඇසේ වන කෝකිල ගීතේ හා ඇසේ වන කෝකිල ගීතේ

සෝක යාවි සිදිලා සොදුරු සිරියා මා හිමි දිනු මේ පෝදා

ශාන්ත මේ රෑ යාමේ..

Music

මේ රැයේ ගීත ගයාලා මේ රැයේ ගීත ගයාලා. සුන්දර රග පාලා

අති සෝබන මේ උදයේ අපි නැලවෙමු පෙම් දහරේ

# සිහින ලොවේ

සිහින ලොවේ මිහිර මැවු මාලි සිනහා නගයි ඔබයි මනාලි

දසන් විදා සුර කෙල්ලක් වාගේ

කෝමලි මා රගන්න මිහිරේ Music

මගෙ සෝක සුසුම් පාවේ රස සිහින පැතුම් හාවේ

නිතර ඔබේ දෙසයි බලන්නේ

පෙම් මිහිරි ගීත රාවේ මේ බඹර තුඩට ආවේ

ඔබේ පිනින් බවයි පෙනෙන්නේ

කවියන්ගෙ අමර ලෝකේ රස දෙමින් නසන සෝකෙ

සුරතලි ඔබ තමයි ලදුන්නේ

මහද මන්දිරේ සාමේ ගෙනෙන සුන්දරී මාගේ

රෝසමල් කුමාරි මා ප්‍රියාවි // සිහින ලොවේ

© 2009 සිසිල් පොන්සේකා

# සිහිනෙන් ඔබ මට

සිහිනෙන් ඔබ මට පෙනෙනවනම් අවදි නොවී ඉන්නම්

කිසිදා ඔබෙ අත නොලැබේ නම් සැමදා තනි වෙන්නම් Music

ආසිරි ගී මැද පෝරුව මත ඉද මහපටැඟිලි බැද අත පැන් වත් කර

ඔබ කැදවා යන්නම් නැතිනම් තනිවෙන්නම්

සිහිනෙන් ඔබ මට .. Music

ජීවන ගමනේ බාධක දුක සැප එකසේ පිළිගෙන හිනැහෙනු මැන ඔබ

තනියට ලග ඉන්නම් නැතිනම් තනිවෙන්නම්

සිහිනෙන් ඔබ මට ..

# සුදු පිරුවට ඇදලා

සුදු පිරුවට ඇදලා නෑ ඒ කන්දකි සුදු මීදුම වැටිලා

කදිමයි සුදු මීදුම වැටිලා කදිමයි සුදු මීදුම වැටිලා

ආකාසේ පොලොවේ ගෑවේ මේ හරියේ සිතුවම් ඇදලා

හරිම ලස්සනයි සිගිරි සිතුවම් මෙ වාගෙම යයි කියම් සිතා

සුදු පිරුවට ඇදලා නෑ ඒ කන්දකි සුදු මීදුම වැටිලා

කදිමයි සුදු මීදුම වැටිලා කදිමයි සුදු මීදුම වැටිලා

Music

උස් කදු මුදුනින් රෑරා ඇද හැලෙනා රිදී දිය දහරා//

අප ඇස් හමුවේ ඇයි දොලකට පෙරලී යන්නේ මුද කරා//

සුදු පිරුවට ඇදලා

Music

තිස්සෙම නිල්වන් අහසේ ලස්සන ඇයි මේ සැන්දෑවේ//

ඔබ ගොස් නවතින්නේ කොයි දෙසෙ දෝ එම්බා වලා කුලේ

සුදු පිරුවට ඇදලා

© 2009 සිසිල් පොන්සේකා

# තනිව් සිටින්නයි මා

**තනිව් සිටින්නයි මා අදහස් කලේ ඔබමයි සොයා ඇවිදින් එය වෙනස් කලේ**

**පහදා කියුවත් නෑ සවන් යොමුකලේ වේදනා පිරි ලොවක් ඔබයි බිහි කලේ**

Music

**මගෙ පාලු ලෝකයේ තනිවූ මෙමා සක්විති රජුන් හමුවේ නැත හිස නමා**

**සිතිවිලි මගේ හසුරා ගත හැක නමා**

**මට දුක සිතෙන්නේ ඔබ ගැන තමා.. තනිව් සිටින්නයි මා**

Music

**ඔබෙ චේතනා අගනා මා සිත දනී අවට ලෝකයේ බැලුම් විස කටු වැනි**

**ඒ කටු අපේ දෙහදේ ගැඹුරේ ඇනී ගලන දුක් වේදනා රුදිරය වැනී. තනිව් සිටින්නයි..**

## තරුණ නෙත් ජය මංගලේ

Music

**හෝ හෝ හෝ හෝ හෝ හෝ**

**තරුණ නෙත් ජය මංගලේ පරම සුවදේ පෙම් සුවේ**

**පෙමට පිදු මෙ ජීවිතේ මිහිර ගෙනදේ මී විතේ හෝ**

**හෝ හෝ හෝ හෝ හෝ හෝ තරුණ නෙත් ..** Music

**සුලග මුමුණයි ලපලු ලෙල දෙයි කුසුම් පලවෙයි ආදරේ**

**රල පතර නිල් ජලය කලඹයි මෙයද අප පෙම් සාගරේ//**

**හෝ හෝ හෝ හෝ හෝ හෝ තරුණ නෙත් ජය මංගලේ...**

**දිනිඳු බැස යයි තරිඳු ලග එයි එලිය එලියට යා වුනා**

**සුනිල දෑතයි සුමුදු දෑතයි එකට එක්වී යා වුනා**

**හෝ හෝ හෝ හෝ හෝ හෝ**

**තරුණ නෙත් ජය මංගලේ පරම සුවදේ පෙම් සුවේ**

**පෙමට පිදු මෙ ජීවිතේ මිහිර ගෙන දේ මී විතේ.** Music

© 2009 සිසිල් පොන්සේකා

# ටිකිරි මැණිකෙ

ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා ගොවිරාල ගොඩට ඇවිල්ලා //

ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා

ගලන දොලින් ඇඟ සෝදාලා කිරල ගහේ හෙවනට වීලා //

නෙලුම් කොලේ එතන තියාලා ටිකිරි මැණිකෙ ඇඹුල බෙදනවා

ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා ගොවිරාල ගොඩට ඇවිල්ලා //

ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා

නියර දිගේ ගොවියෝ එනවා බෙදන ඇඹුල රසකර කනවා //

ඔමරි හිනා ගඩ පැතිරෙනවා මුලු ගමටම කිරි ඉතිරෙනවා

ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා ගොවිරාල ගොඩට ඇවිල්ලා //

ටිකිරි මැණිකෙ ඇඹුල ගෙනල්ලා

# උඩරට කඳුකරයේ

උඩරට කඳුකරයේ ගමනක් යන කළ ඒ

දුම්රිය උඩරට මැණිකේ ස්වර්ණා හමුවූයේ

Inter / A / / / / / / / / /

නාදලු තොල් අතරින් සිනාව හෙලුවා

ඇයගේ මුහුණේ ශ්‍රියාවෙන් මෙමන් මත්වූවා

උඩරට කඳුකරයේ..

Inter / A / / / / / / / / /

මගෙ හද දිණුව කුමාරි ස්වර්ණයකි ඔබ

පිරිසිදු සිතින් සිතාලයි ආවේ ඔබව සොයා

උඩරට කඳුකරයේ..

© 2009 සිසිල් පොන්සේකා

# උන්මාද සිතුවම්

Music

**උන්මාද සිතුවම් මැවේ බිඳේ මිහිඳුම් වලා මැද අතීතයේ**

**බිඳුණු පෙමින් ගිනිගත් හදවත් තනිවේ වි එක්ටැම් ගේ**

**අනන්ත සයුරේ බියකරු දිවි දියඹේ**

**පාලු හුදකලා සුළඟ පමණී උරුමේ**

**හඬා වැටෙන සිත සදා සරණ මත**

**තනිවේවි එක්ටැම් ගේ**

**උන්මාද සිතුවම්**

Music

**දහසක් මල් මැද එමක මලයි පැතුවේ**

**එමල කිමද සරදම් කර සැගව ගියේ**

**දැනේ තවම මට මලේ සුවඳ පොද**

**තනිවේවි එක්ටැම් ගේ**

**උන්මාද සිතුවම්**

© 2009 සිසිල් පොන්සේකා

# වැල්ලේ කිරි වැල්ලේ

වැල්ලේ කිරි වැල්ලේ හාදු දේවී

ජීවනයෙ ප්‍රෙම මැණික් පෑදේවී

ප්‍රෙම අමා පානේ මුව මී දේවී

ලෝකෙම මා පාමුල මෙන තේරේවී

මැණික ලැබුණි මාගෙ පෙර පිනකින් වාගෙ

ඕලු නෙලුම් මානෙල් මදු සංයෝගේ

විහිලු කරයි ප්‍රෙමෙට අපි දෙන්නාගේ

වැල්ලේ කිරි වැල්ලේ හාදු දේවී

ජීවනයෙ ප්‍රෙම මැණික් පෑදේවී

Music

කියන්න කියන දෙයක් ඇයිද ඉන්නෙ තාම බලා

නොදන්නවාද සිහින ලොවෙහිත් මා ප්‍රෙම කලා

ගම්මානේ පෙම් සිහිනේ එලිවෙන්නේ එලිවෙන්නේ ගම්මානේ

අසරන කෙල්ලෙකි මා කුල සිරිතට දෙන්නෙ නැතී

,මට දායාද මොටද ඔබේ සිනා රැල්ල ඇති

දැනගෙන රහස අපේ කෙකටිය කැකුල පිපේ//

ඕලු නෙලුම් මානෙල් මදු සංයෝගේ

විහිලු කරයි ප්‍රෙමෙට අපි දෙන්නාගේ

වැල්ලේ කිරි වැල්ලේ හාදු දේවී

ජීවනයෙ ප්‍රෙම මැණික් පෑදේවී

© 2009 සිසිල් පොන්සේකා

# වැල්ල සිඹින රැල්ල

**වැල්ල සිඹින රැල්ල අපට මෙහෙම කියනවා**

**අදට වඩා එළිය හදක් හෙට පායනවා**

**දෙතුන් දවස කන්න නැතත් සෝක නෑ හිතේ**

**විනෝද මිහිරක් ගෙනදේ මුදු ජීවිතේ**

**ලලයි ලිලලි ලයි සිසිලයි සුලගයි//**

Music

**හිරු බැස යන්නේ සඳපාන සිනාසෙන්නේ**

**බත් බැද ගන්නේ පැල්පතින් පිටත් වන්නේ**

**වෙරලට එන්නේ අඹුදරු සිප සනසන්නේ**

**එදිනෙදා වේල සොයාගන්න දියඹට ඉපදෙන්නේ**

**ලලයි ලිලලි ලයි සිසිලයි සුලගයි//**

**වැල්ල සිඹින රැල්ල**

Music

**දැල් පටවාලා ඔරු පාරු වල ගොහිල්ලා**

**මලු පුරවාලා එමු තෝරු මෝරු අල්ලා**

**එය විකුණාලා වෙන්දේසියේ දමාලා**

**අපි කුසේ ගින්න නිවා ගන්න කාසි හොයාපල්ලා**

**ලලයි ලිලලි ලයි සිසිලයි සුලගයි//**

**වැල්ල සිඹින රැල්ල**

© 2009 සිසිල් පොන්සේකා

## වඳිම් සුගත සෑසි පියා

**වඳිම් සුගත සෑසි පියා සුදු අරලිය මලිනි පුදා**

**සසර දුකිනි එතෙර වන්න පතමි නිවන් සැපත අමා**

Music

**ලුම්බිණියේ සල් උයනේ මායා කුසින් බිහි විලා**

**පිවිතුරු පියුමන් අතරින් වැඩ සිට සිහ නාද කලා**

**වඳිම් සුගත සෑසි පියා**

Music

**නේරංජන ගග අසබඩ බෝ සෙවනෙහි වැඩ හිඳලා**

**මරු බල මැඩ බුදු බව ලැබ ලොව දහමින් එකලු කලා**

**වඳිම් සුගත සෑසි පියා**

Music

**ලෝ සත හට නිවනට මග නැනවින් පහදා දීලා**

**මලල රටේ සල් සෙවනක පිරි නිවුනා සැනසීලා**

**වඳිම් සුගත සෑසි පියා**

© 2009 සිසිල් පොන්සේකා

## වලා කුලක් පලා අම්බරේ

Intro

වලා කුලක් පලා අම්බරේ සිනා නගන සදේ කැන් පිරේ

ඔබේ මුහුණ දකින වරේ හදේ අඳුර තුරන් කෙරේ

පසලොස්වක පෝය මට අදයි

පසලොස්වක පෝය මට අදයි

Interludes

වසන්තයේ දද නංවාලා කසුන් අසුන් මත නැංවීලා

සුව වින්දත් ඔබ නැති වීලා මට පල නැත කිරුළ දරාලා

වලා කුලක් පලා අම්බරේ සිනා නගන සදේ කැන් පිරේ

ඔබේ මුහුණ දකින වරේ හදේ අඳුර තුරන් කෙරේ

පසලොස්වක පෝය මට අදයි

පසලොස්වක පෝය මට අදයි

Interludes

දස දහසක් සුර ලදුන් මැද පරසතු මල් සුවඳ විද විද

සිටියත් ඔබ ලගින් නැති සඳ මට සක්විති පදවි කුමටද

වලා කුලක් පලා අම්බරේ සිනා නගන සදේ කැන් පිරේ

ඔබේ මුහුණ දකින වරේ හදේ අඳුර තුරන් කෙරේ

පසලොස්වක පෝය මට අදයි

පසලොස්වක පෝය මට අදයි

Ending

© 2009 සිසිල් පොන්සේකා

# වන දෙව් ලිය

Music

**වන දෙව් ලිය තුරුලේ සැතපෙන සිගිරියේ**

**පෙර කළ සිත්තරුවෝ බිතු සිතුවම් නෙලුවෝ**

Music

**සිත පණ ගන්වන හදෙහි නිදන් වන**

**රූබර ළඳුනගෙ මදහස පෙන්වන//**

**කළා වැවේ සුලගින් ඇගෙ හද සලිත වෙලා**

**කළා රසික හෙලයන් සිගිරි අගන නෙලා**

Music

**සඳ වැනි මුව ඇති රූබර ළඳුනනි**

**කළා රසය ලොව හඬගා කියමිනි**

**දහස් ගණන් නරඹා සිගිරි බැස යනවා**

**කළා රසය හොබවා සිතුවම් පවතිනවා**

**වන දෙව් ලිය තුරුලේ**

© 2009 සිසිල් පොන්සේකා